මුදල් ප්‍රතිපත්ති විවරණය සැකෙවින්


2026 ජූලි

මහ බැංකුවේ අලුත් ම තීරණය කුමක් ද?

එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය 8.75%ක් ලෙස **නොවෙනස් ව තැබීමට** මහ බැංකුව තීරණය කළා

8.75%

වත්මන් ආර්ථික තත්ත්වය කෙසේ ද?



- බලශක්ති සහ ආහාර මිල ගණන් වැඩි වීම හේතුවෙන් උද්ධමනය ඉහළ ගිය ද, උද්ධමන අපේක්ෂා මැදිකාලීන ව 5%ක ඉලක්කය වටා ස්ථායී ව පවතී
- මහ බැංකුව විසින් ගනු ලැබූ මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ක්‍රමයෙන් ආර්ථිකය වෙත සම්ප්‍රේෂණය වේ
- ණය සේවාකරණ ගෙවීම් මධ්‍යයේ වුව ද, 2026 වසරේ ජුනි අවසානය වනවිට නිල දළ සංචිත එ.ජ. ඩොලර් බිලියන 6.45ක් ලෙස පවතී
- ඉන්ධන ආනයන වියදම් ඉහළ යෑම සහ සංචාරක ඉපැයීම් පහළ යෑම හේතුවෙන් විදේශීය ජංගම ගිණුමේ අබණ්ඩ හිඟයක් වාර්තා වී ඇත
- 2026 වසරේ මේ දක්වා කාලය තුළ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් ශක්තිමත් ව පවතී
- මෑත කාලීන ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ශ්‍රී ලංකා රුපියල උච්චාවචනය වීම අවම කිරීමට සහාය දක්වයි

අනාගතයේ දී ආර්ථිකයට කුමක් සිදු විය හැකි ද?



- මතුපිට උද්ධමනය 5%ක උද්ධමන ඉලක්කයට ළඟා වීමට පෙර නුදුරු කාලයේ දී ඉලක්කයට වඩා ඉහළ මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ
- මෑත කාලීන ව ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවලට ප්‍රතිචාර වශයෙන් ණය ප්‍රසාරණය සහ මෝටර් රථ වාහන ආනයන ඇතුළු ව ආනයන ඉල්ලුම අඩු වනු ඇතැයි බලාපොරොත්තු වේ

දේශීය සහ ගෝලීය ආර්ථික ප්‍රවණතා සමීප ව නිරීක්ෂණය කරමින් සහ ආර්ථික වර්ධනයට සහාය වෙමින් මැදිකාලීනව උද්ධමනය 5%ක ඉලක්කගත මට්ටමේ පවත්වා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට මහ බැංකුව සූදානමින් සිටිනවා

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA